# කෝවිඩ්සේෆ් (COVIDSafe) ඇප් එක සම්බන්ධ පුද්ගලිකතා ප්‍රතිපත්තිය

ඔබගේ පුද්ගලික තොරතුරු කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් සොයා දැන ගන්න.

**මෙම පිටුවෙහි ඇති දෑ**

- What personal information will be collected, and why is it being collected?
- How will personal information be collected?
- How will personal information be stored?
- How will personal information be used and disclosed?
- Can personal information be deleted?
- Can a user correct or access personal information?
- Further information about privacy
- Contact us

**ඉංග්‍රීසි හැර වෙනත් භාෂාවලින් කෝවිඩ්සේෆ් පුද්ගලිකතා ප්‍රතිපත්තිය කියවන්න.**

ඩිජිටල් පරිණාමන ඒජන්සියේ (Digital Transformation Agency) උපකාරය ඇතිව ඕස්ට්‍රලියානු සෞඛ්‍යය දෙපාතර්මේන්තුව (දෙපාතර්මේන්තුව) මගින් COVID-19 පැතිරීම වැළැක්වීම සඳහා ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන්හි සෞඛ්‍යය බලධාරීන් (සෞඛ්‍යය බලධාරීන්) හට උපකාර කිරීම සඳහා රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව සොයා ගැනීම සඳහා COVIDSafe ක්‍රියාත්මක කෙරේ.

රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව සොයා ගැනීම (contact tracing) යනු රෝගය පැතිරීම සම්බන්ධ මහජන සෞඛ්‍යය ප්‍රතිචාරයේ මූලික අංගයකි. මේ මගින් COVID-19 ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සිදුවේ. ඒ මගින් තව දුරටත් COVID-19 පැතිරීම වැළැක්වීම නැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාගර් ගන්නා ලෙසට එම අයට උපදෙස් ලබාදිය හැකිය (පරීක්ෂාකර ගැනීම හෝ ස්වයං හුදකලාවීම ආදී).

මෙම පුද්ගලිකතා ප්‍රතිපත්තිය මගින් 1988 පුද්ගලිකතා පනත (*Privacy Act 1988*) COVIDSafe ඔස්සේ රැස්කරන පුද්ගලික තොරතුරු පරිහරනය කරන ආකාරය පිළිබඳව දක්වයි. මෙම පනත 2020 මැයි මාසයේදී පුද්ගලිකතා සංශෝධන (2020 මහජන සෞඛ්‍යය සම්බන්ධතා තොරතුරු පනත) මගින් කෝවිඩ්සේෆ් ඇප් එක භාවිතා කරන අය සහ ඇප් එක මගින් රැස්කල තොරතුරු සඳහා වඩා හොඳ ආරක්ෂාවක් ලබා දීම සඳහා සංශෝධනය කරන ලදී.

සෞඛ්‍යය දෙපාතර්මේන්තුවේ ලේකම් මගින් නිණර්ය කරන ලද්දේ ජාතික කෝවිඩ්සේෆ් දත්ත ගබඩා පරිපාලක වන්නේ ඩිජිටල් පරිණාමන ඒජන්සිය (අපි) වන බවයි. එය මගින් ඔබගේ පුද්ගලික තොරතුරු මෙම ප්‍රතිපත්තිය සහ 1988 පුද්ගලිකතා පනත අනුව පමණක් රැස් කිරීම, භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම සිදු කරනු ඇත. ඔබ ඇප් එක භාවිතා කරන විට ඔබ සම්බන්ධයෙන් රැස් කරන පුද්ගලික තොරතුරු වෙත ඕස්ට්‍රලියානු සෞඛ්‍යය දෙපාතර්මේන්තුව හට ප්‍රවේශය නැත.

## රැස්කරන්නේ කුමන පුද්ගලික තොරතුරුද සහ ඒවා රැස් කරන්නේ කුමන හේතුව නිසාද?

අප පුද්ගලික තොරතුරු රැස් කරන්නේ ඔබ COVIDSafe සමඟ ලියාපදිංචිවූ විට, එය භාවිතා කරන විට, හෝ ඒ වෙත දත්ත එක් කරන විට රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව සොයා ගැනීම උපකාර කිරීම සඳහාය.

### ඔබ COVIDSafe හා ලියාපදිංචිවන විට

පහත දේ රැස්කිරීමට කැමැත්ත ලබාදෙන ලෙස අප විසින් ඉල්ලා සිටිනු ඇතඃ

- ජංගම දුරකථන අංකය - ඒ මගින් රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව සොයා ගැනීමට අවශ්‍යනම් ඔබ හා සම්බන්ධ විය හැකිය
- නම - රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව සොයා ගැනීම සිදු කරන විට අදාල සෞඛ්‍යය බලධාරීන් විසින් නිවැරදි පුද්ගලයා සමඟ කථා කරන්නේද යන්න සනාථ කරගත හැකිවේ. ඔබගේ සම්පූර්ණ නම ලබාදෙන්නේ නම් මෙය ඉතා පහසු වනු ඇත. නමුත් ඔබගේ මනාපය ව්‍යාජ නමක් ලබාදීම නම්, එසේ කල හැකිය
- වයස් පරාසය - මේ මගින් සෞඛ්‍යය බලධාරීන් හට අවශ්‍ය අවස්ථාවල මුලින් කථාකල යුතු අය හට ප්‍රමුඛතාවය ලබාදිය හැකිවේ
- පෝස්ට්කෝඩය - ඔබගේ ප්‍රදේශයට අදාල ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයේ සෞඛ්‍යය බලධාරීන් විසින් ඔබ හා සම්බන්ධවන බවට සහ අවශ්‍ය අය සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය ලබාදීම සහතික කිරීම සඳහා, උදා. පැතිරෙන ප්‍රදේශ.

ඔබ වයස අවුරුදු 16ට අඩුනම්, ඔබගේ ලියාපදිංචිවීමේ තොරතුරු සහ සම්බන්ධවීමේ දත්ත රැස්කිරීම සම්බන්ධයෙන් ඔබගේ දෙමාපියන් හෝ භාරකරුවෙකු කැමැත්ත ලබාදිය යුතුය.

### ඔබ COVIDSafe භාවිතා කරන විට

ඔබගේ ඇප් එක පහත සම්බන්ධතා දත්ත (contact data) පමණක් වාර්තා කර තබයිඃ (1) සංකේතගත කල (encrypted) භාවිත හැඳුනුම (user ID), (2) සම්බන්ධතාවයේ වේලාව සහ දිනය (3) බ්ලූටූත් සංඥාවල ශක්තිමත්බව සහ (4) ඔබ හා සම්බන්ධවුණු වෙනත් COVIDSafe භාවිතා කරන අයගේ දුරකථනයේ නිෂ්පාදනය සහ මොඩලය. මෙම තොරතුරු අනෙක් භාවිතා කරන අයගේ උපකරණවල වාර්තා වන අතර සංකේතාත්මක ආකාරයට ගබඩා කර තැබේ.

සෑම පැය දෙකකට වරක්ම සංකේතගත කල භාවිත හැඳුනුමක් ජනනයවේ. මෙය රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව හඳුනා ගැනීමට අවශ්‍ය අවස්ථාවක භාවිතය සඳහා ඩිජිටල් පරිණාමන ඒජන්සියේ ජාතික COVIDSafe දත්ත ගබඩාවේ (දත්ත ගබඩාව) සටහන්වේ.

කිසිදු අවස්ථාවක ඔබ සිටින ස්ථානය සම්බන්ධ දත්ත (ඔබ සිටින ස්ථානය සොයන දත්ත) රැස් කරන්නේ නැත. සිය උපකරණවල තැන්පත් කර ඇති සම්බන්ධතා දත්ත සංකේතගත කර ඇති බැවින් ඒවා භාවිතා කරන අය හට දැකිය නොහැක. සම්බන්ධතා දත්ත විසංකේතගත කිරීමට (decrypt) ගන්නා ඕනෑම උත්සාහයක් නීතිය ඉදිරියේ වරදකි. උපකරණයක තැන්පත් කර ඇති සම්බන්ධතා දත්ත දින 21කට පසුව ස්වයංක්‍රීයව මකා දැමෙනු ඇත.

භාවිතා කරන අයෙකු විසින් දත්ත ගබඩාව වෙත දත්ත එක් කිරීමට අනුමැතිය ලබාදෙන තුරු උපකරණයක තැන්පත් කර ඇති සම්බන්ධතා දත්තවලට ප්‍රවේශවීමට හෝ සෞඛ්‍යය බලධාරීන් සමඟ හුවමාරු කර ගැනීමට අපට නොහැක.

### ඔබට COVID-19 ආසාදනයවී ඇති බවට පරීක්ෂාවකින් සනාථවුනිනම්

සෞඛ්‍යය බලධාරියෙකු ඔබ හා සම්බන්ධවී ඔබට SMS පණිවුඩ මගින් එවීම සඳහා PIN අංකයක් ජනනය කිරීමට ඔබගේ ජංගම දුරකථන අංකය දත්ත ගබඩාවට ඇතුළු කිරීමට ඔබගේ කැමැත්ත ඉල්ලා සිටිනු ඇත.

ඔබ විසින් PIN අංකය ඇතුලත් කලහොත්, ඔබගේ උපකරණයේ ඇති සම්බන්ධතා දත්ත, දත්ත ගබඩාව වෙත එක්කර ගැනීමට ඔබ අනුමැතිය ලබාදෙන අතර ඒ මගින් එම දත්ත සෞඛ්‍යය බලධාරීන් සමඟ හුවමාරු කර ගන්නා අතර ඔවුන් විසින් රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව සොයා ගැනීම පහසු කරනු ඇත.

වෙනත් භාවිතා කරන අයෙකු COVID-19 රෝගය වැළඳී ඇති බවට පරීක්ෂාවකින් සනාථ වුනිනම්, ඔවුන් විසින් ඔවුන්ගේ සම්බන්ධතා දත්ත එක්කල හැකි අතර, එහි ඔවුන් ඔබ හා සම්බන්ධවුනු තොරතුරු තිබිය හැකිය.

## පුද්ගලික තොරතුරු රැස්කරන්නේ කෙසේද?

COVIDSafe භාවිතය සම්පූර්ණයෙන්ම ස්වේච්ඡාවෙන්ය. ඕනෑම අවස්ථාවක COVIDSafe ඇප් එක ස්ථාපනය කිරීම හෝ මකා දැමීම ඔවුනට කල හැකිය.

ඔබගේ COVIDSafe භාවිතයේ කොටසක් වශයෙන් පහත දේ අප විසින් රැස්කරනු ඇතः

- ඔබට SMS පණිවුඩයක් මගින් ලැබෙන PIN අංකයක් ලැබීමෙන් පසු එය සාර්ථකව ඇතුළු කිරීමෙන් පසු ඔබගේ ලියාපදිංචි තොරතුරු
- ඔබගේ උපකරණයේ COVIDSafe ඇප් එක විවෘතව තබා ඇතිවිට හෝ එය ක්‍රියාත්මක වන අවස්ථාවල ඔබගේ සංකේතගත කරන ලද භාවිත හැඳුනුම සම්බන්ධ තොරතුරු
- ඔබගේ සම්බන්ධතා දත්ත එක් කිරීමට හැකිවනසේ ඔබට සෞඛ්‍යය බලධාරියෙකු විසින් SMS පණිවුඩයක් එවූ පසු ඔබ විසින් එයට එකඟතාවය පලකර පසු ඔබට COVID-19 පරීක්ෂණයක් මගින් රෝගය ඇති බවටවූ තොරතුරු
- ඔබ COVID-19 පරීක්ෂණයක් මගින් රෝගය ඇති බවට තහවුරුවූ විට ඔබගේ සම්බන්ධතා දත්ත ඔබගේ උපකරණයට ගැනීමට එක් කිරීමට එකඟතාවය පලකරන විට, ඔබගේ සම්බන්ධතා දත්ත
- කෝවිඩ්සේෆ් භාවිතා කරන වෙනත් අයෙකු COVID-19 පරීක්ෂණයක් මගින් රෝගය ඇති බවට තහවුරුවූ විට ඔවුන්ගේ සම්බන්ධතා දත්ත ඔවුන්ගේ උපකරණයට ගැනීමට එක් කිරීමට එකඟතාවය පලකරන විට, ඔවුන්ගේ සම්බන්ධතා දත්ත

කිසිදු භාවිතා කරන අයෙකු හට COVIDSafe ස්ථාපනය කිරීමට හෝ දිගින් දිගටම භාවිතා කිරීමට, හෝ දත්ත ගබඩාවට සම්බන්ධතා දත්ත එක් කිරීමට බල කරනු ලබන බවට සිතිය යුතු නැත. 1988 පුද්ගලිකතා පනත යටතේ මෙය තහනම්වේ. මෙවන් කිසියම් දෙයක් කිරීමට ඔබට බලකිරීමක් ඇති බවට සිතෙයි නම්, ඔබ විසින් ඕස්ට්‍රලියානු තොරතුරු කොමසාරිස්වරයාගේ කාර්යාලය (Office of the

Australian Information Commissioner) සහ/හෝ ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලීසිය වෙත පැමිණිල්ලක් යොමු කල හැකිය.

## පුද්ගලික තොරතුරු තැන්පත්කර තබන්නේ කෙසේද?

අප විසින් සියළුම ලියාපදිංචි තොරතුරු, සංකේතගත කරන ලද භාවිත හැඳුනුම් සහ සම්බන්ධතා දත්ත, දත්ත ගබඩාවේ තැන්පත් කර තබනු ඇත. මෙය ඕස්ට්‍රේලියාවේ පිහිටි යටිතල පහසුකම් භාවිත කරන ක්ලවුඩ් පදනම්වූ පහසුකමකි. මෙය ‘ආරක්ෂිත’ ආරක්ෂණ මට්ටමට දත්ත තැන්පත් කර තැබීමට යෝග්‍ය ආකාරයට වර්ගීකරණය කර ඇත.

2018 පුද්ගලිකතා පනතේ අවශ්‍යතා අනුව කෝවිඩ්සෙෆ් දත්ත කාලය අවසන්වූ බවට සෞඛ්‍යය අමාත්‍යවරයා විසින් නිර්ණය කල විගස අප විසින් සියළුම දත්ත, දත්ත ගබඩාවෙන් මකා දමනු ඇත.

ඔබගේ උපකරණයේ ඇති සම්බන්ධතා දත්ත අදාල සම්බන්ධවීම සිදුවූ දින සිට දින 21ක් ඇතුලත ස්වයංකී්‍රයව මකා දැමෙනු ඇත. තවද, ඔබ විසින් ඔබගේ උපකරණයෙන් COVIDSafe ඉවත් කලහොත් හෝ ඔබගේ සම්බන්ධතා දත්ත, දත්ත ගබඩාව වෙත එක් කලහොත්ද ඒවා මැකෙනු ඇත.

## පුද්ගලික තොරතුරු භාවිතා කිරීම සහ හෙළිදරව් කිරීම කෙසේ සිදුවේද?

සෞඛ්‍යය බලධාරීන් විසින් රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව සොයා ගැනීමට හැකිවන ආකාරයට ඔබගේ පුද්ගලික තොරතුරු භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම සිදු කරනු ඇත. මේවා අතරට පහත දේ ඇතඃ

- ඔබගේ දුරකථන අංකය සනාථ කිරීම සඳහා හෝ ඔබගේ සම්බන්ධතා දත්ත එක් කිරීම සඳහා ඔබට SMS පණිවුඩයක් යැවීමට ඔබගේ ජංගම දුරකථන අංකය භාවිතා කිරීම
- පසුගිය දින 21 ඇතුලත COVIDSafe භාවිතා කරන අයෙකු හට රෝගය ඇති බවට සනාථවූ විට ඒ හා සම්බන්ධවුණු අනෙක් COVIDSafe භාවිතා කරන්නන් හඳුනා ගැනීම සඳහා එක් කරන ලද සම්බන්ධතා දත්තවල ඇති සංකේතගත කරන ලද භාවිත හැඳුනුම් භාවිතා කිරීම (සම්බන්ධවුණු භාවිතා කරන්නන්)
- රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව සොයා ගැනීමට හැකිවන පරිදි සෞඛ්‍යය බලධාරීන් හට ලියාපදිංචිවීමේ තොරතුරු සහ සම්බන්ධතා දත්ත සඳහා ප්‍රවේශය ලබාදීම.

සම්බන්ධවුණු භාවිතා කරන්නන් හට සිය ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් අවශ්‍යවන පරිදි ක්‍රියාමාගර් ගැනීමට උපදෙස් ලබාදෙනු ඇත (ස්වයං හුදකලාවීම ආදී). මෙම ක්‍රියාමාගර්වලට අනුව කටයුතු නොකිරීම ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයන්ගේ නීතිය උල්ලංඝනය කිරීමක් විය හැකිය.

අප විසින් ඔබගේ පුද්ගලික තොරතුරු භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම කරනු ඇතඃ

- කෝවිඩ්සේෆ් හි නිසි ක්‍රියාකාරිත්වය, නිව්‍යර්‍යජබව හෝ ආරක්ෂාව හෝ දත්ත ගබඩා කිරීම තහවුරු කිරීමට
- කෝවඩ්සේෆ් මගින් ලියාපදිංචිවූ සම්පූණර් සංඛ්‍යාව සම්බන්ධ සංඛ්‍යාත්මක තොරතුරු සකස් කිරීමට

- දත්ත ගබඩාවේ ඇති පුද්ගලික තොරතුරු මකා දැමීමට ඔබ විසින් ඉල්ලීමක් කල විට, නිවැරදි තොරතුරු මකා දමන ලද බව සනාථ කිරීමට
- 1988 පුද්ගලිකතා පනතේ VIIIA කොටස යටතේ ඇති වගකීම් ඉටු කිරීමට සහ බලතල ක්‍රියාත්මක කිරීමට තොරතුරු කොමසාරිස් වෙත
- අවශ්‍ය නම්, 1988 පුද්ගලිකතා පනතේ VIIIA කොටස යටතේ කඩකිරීම් විමශර්නය කිරීම් සහ නඩු පැවරීම් කටයුතු සඳහා.

ඔබගේ පුද්ගලික තොරතුරු වෙන කිසිදු අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීම හෝ හෙළිදරව් කිරීම නොකරනු ඇත.

## පුද්ගලික තොරතුරු මකා දැමිය හැකිද?

ඔබට ඕනෑම අවස්ථාවක COVIDSafe ඉවත්කල හැකිය. මේ මගින් ඔබගේ උපකරණයේ තැන්පත්වී ඇති සියළුම තොරතුරු ස්වයංක්‍රීයව මකා දැමෙන අතර ඔබගේ සම්බන්ධතා දත්ත අනෙක් භාවිතා කරන අය විසින් රැස් කිරීමද නවතී.

COVIDSafe ඉවත් කිරීම මගින් දත්ත ගබඩාවේ දැනටමත් එකතුවී ඇති තොරතුරු හෝ පසුගිය දින 21 ඇතුලත වෙනත් භාවිතා කරන අයෙකුගේ උපකරණයක තැන්පත්වී ඇති ඔබගේ සම්බන්ධතා දත්ත ස්වයංක්‍රීයව මකා දැමීමක් සිදු නොවේ. මෙම තොරතුරු දත්ත ගබඩාව වෙත එක් කල හැකි අතර රෝගය ආසාදනයවූ අය හා සම්බන්ධවූ අයව සොයා ගැනීමේ අරමුණ වෙනුවෙන් තව දුරටත් ලබාගත හැකිය. දත්ත ගබඩාවට එක්වුණු ඔබගේ සම්බන්ධතා දත්ත මකා දැමීමට ඔබ අදහස් කරන්නේ නම්, ඔබ විසින් ප්‍රකාශිතවම ඔබගේ තොරතුරු මකා දමන ලෙස දෙපාතර්මේන්තුවෙන් ඉල්ලා සිටිය හැකිය.

## භාවිතා කරන අයෙකු විසින් පුද්ගලික තොරතුරුවලට ප්‍රවේශවීම හෝ නිවැරදි කිරීම කල හැකිද?

ඔබ හට පහත දේ කල හැකියඃ

- COVIDSafe මකා නැවත ස්ථාපනය කිරීම මගින් ඔබගේ ලියාපදිංචි තොරතුරු වෙනස් කල හැකිය
- අප හා සම්බන්ධවීම මගින් අපගේ දත්ත ගබඩාවේ තැන්පත්කර ඇති ඔබගේ ලියාපදිංචි තොරතුරු මකා දැමිය හැකිය
- COVIDSafe හි නිවැරදි තොරතුරු ලියාපදිංචි කිරීම.

ඔබගේ දත්තවල උපරිම ආරක්ෂාව තහවුරු කිරීම සඳහා, දත්ත ගබඩාවේ තැන්පත් කර ඇති තොරතුරු වෙත ඔබට ප්‍රවේශවිය නොහැක.

## පුද්ගලිකතා ප්‍රතිපත්තිය සම්බන්ධ වැඩිදුර විස්තර

කෝවිඩ්සේෆ් ඇප් එක සහ ඔබගේ පුද්ගලිකතා අයිතිවාසිකම් සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා, ඕස්ට්‍රේලියානු තොරතුරු කොමසාරිස්වරයාගේ කායර්ාල මගින් ඕස්ට්‍රලියානු රජයේ කෝවිඩ්සේෆ් ඇප් එක සම්බන්ධයෙන් 1988 පුද්ගලිකතා පනත අදාල වන ආකාරය දක්වයි.

## දෙපාතර්මේන්තුව හා සම්බන්ධ වන්න



**කෝවිඩ්සේෆ් පුද්ගලිකතා විමසීම් සහ පැමිණිලි**

**කෝවිඩ්සේෆ් පුද්ගලිකතා හෝ පුද්ගලිකතා විමසීමක් හෝ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සඳහා අප හා සම්බන්ධ වන්න.**

පුද්ගලිකතා නිලධාරී [privacy@health.gov.au](mailto:privacy@health.gov.au)
දුරකථන 02 6120 8707
නොමිලේ කථාකල හැකි දුරකථන අංක [1800 020 103]
**තැපැල් ලිපිනයඃ**
Digital Transformation Agency
GPO Box 457, Canberra, ACT 2601

සාමාන්‍ය ආකාරයේ විමසීම් සම්බන්ධයෙන් පුද්ගලිකතා නිලධාරී විසින් ප්‍රතිචාර සඳහා ඕස්ට්‍රලියානු රජයේ සෞඛ්‍යය දෙපාතර්මේන්තුව වෙත යොමු කරනු ඇත. පුද්ගලිකතාව සම්බන්ධ පුද්ගලයන් විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි පුද්ගලිකතා නිලධාරී විසින් 1988 පුද්ගලිකතා පනත යටතේ කටයුතු කරනු ඇත. මෙයට ඕස්ට්‍රලියානු තොරතුරු කොමසාරිස්වරයා විසින් කරන උල්ලංගණය කිරීමක් පරීක්ෂණයකට යොමුකිරීමේ අවශ්‍යතාවයද ඇතුලත් වනු ඇත.

විකල්ප වශයෙන් ඔබ විසින් පහත දේ කල හැකියඃ

- ඕස්ට්‍රලියානු තොරතුරු කොමසාරිස්වරයා වෙත සෘජුවම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සහ/හෝ
- ඕස්ට්‍රලියානු ෆෙඩරල් පොලීසිය වෙත පැමිණිල්ලක යොමු කිරීම.

අවසාන වශයෙන් යාවත්කාලීන කලේඃ

2020 ජූලි 07

**Tags:**

- Communicable diseases
- Emergency health management